# තනතුරු - ඇබෑර්තු

## වයඹ පළාත් සභා රාජ්‍ය සේවයේ පළාත් ආදායම් සේවයේ පළාත් ආදායම් කොමසාරිස් තනතුර සඳහා බඳවා ගැනීම - 2018

(විධායක නිලධාරි සේවා ගණය 1 ශ්‍රේණිය)

01. වයඹ පළාත් ගරු ආණ්ඩුකාරතුමාගේ නියමය පරිදි වයඹ පළාත් ආදායම් දෙපාර්තමේන්තුවේ පළාත් කොමසාරිස් තනතුර සඳහා සුදුසුකම්ලත් ශ්‍රී ලාංකික ස්ත්‍රී/පුරුෂ දෙපක්ෂයෙන්ම අයදුම්පත් කැඳවනු ලැබේ.

02. *තනතුරු නාමය* : පළාත් ආදායම් කොමසාරිස් (විධායක නිලධාරි සේවා ගණය 1 ශ්‍රේණිය)

03. *සේවා කොන්දේසි :*

I. මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය.

II. රාජ්‍ය සේවයේ තනතුරුවලට බඳවා ගැනීම සම්බන්ධයෙන් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට්* පත්‍රයේ I වන කොටසේ II 'අ' කොටසේ ඇතුලත් පොදු කොන්දේසිවලට යටත් විය යුතු ය.

04. වැටුප් කාණ්ඩය හා වැටුප් පරිමාණය : SL 1-2016
රු. 47,615 - 10x1335 - 8x1630 - 17x2170 - රු. 110,895 එසේ වුවත්, රාජ්‍ය පරිපාලන චක්‍ර ලේඛ 3/2016 විධිවිධානවලට අනුකූලව එහි උපලේඛන IIහි පරිදි වැටුප ගෙවනු ලැබේ.

05. *සුදුසුකම් :*

1. ඉල්ලුම්පත් කැඳවන අවසාන දිනට වයඹ පළාත් සභාවේ පළාත් ආදායම් දෙපාර්තමේන්තුවේ හෝ වෙනත් කිසියම් පළාත් සභාවක හෝ පළාත් ආදායම් දෙපාර්තමේන්තුවක හෝ දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ - ආදායම් සේවයට බැඳී වසර 20 ක සක්‍රීය සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

*සහ*

විධායක නිලධාරී ගණයේ (1 වන ශ්‍රේණියේ) අවම වශයෙන් වසර 03 ක සක්‍රීය සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

2. ඉල්ලුම්පත් කැඳවන අවසාන දිනට පූර්වාසන්නයෙන් වසර 05 ක සක්‍රීය සතුටු දායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබිය යුතු ය.

06. *බඳවා ගැනීමේ ක්‍රමය :*

පත්වීම් බලධරයා විසින් පත් කරනු ලබන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක නිර්දේශය මත අයදුම්කරුවන් අතරින් සුදුසු නිලධාරියෙකු පළාත් ආදායම් කොමසාරිස් තනතුරට බඳවා ගනු ලැබේ.

07. *සම්මුඛ පරීක්ෂණයේ ලකුණු ලබා දීමේ ක්‍රමවේදය :*

| *අනු අංකය* | *නිර්ණායක* | *ලකුණු ප්‍රමාණය* |
|---|---|---|
| 01 | ආදායම් සේවයේ නිලධාරියෙකු වශයෙන් සේවය කර ඇති එක් වසරක කාලයක් සඳහා ලකුණු 02 බැගින් වසර 20 ක් සඳහා | ලකුණු 40 |
| 02 | *අධ්‍යාපන සුදුසුකම් :*<br>I. උපාධියක් සඳහා | ලකුණු 05 |
| | II. පශ්චාත් උපාධි ඩිප්ලෝමාවක් සඳහා (විෂයට අදාලව) | ලකුණු 10 |
| | III. පශ්චාත් උපාධියක් සඳහා (විෂයට අදාලව) | ලකුණු 15 |
| | (ලබා ඇති උසස්ම අධ්‍යාපන සුදුසුකම සඳහා පමණක් ලකුණු ලබා දෙනු ලැබේ.) | |
| | IV. ඉංග්‍රීසි භාෂාව සඳහා මාස 06 කට නොඅඩු ඩිප්ලෝමාවක් සඳහා | ලකුණු 10 |
| | (අධ්‍යාපන සුදුසුකම් මත ලබා දෙන උපරිම ලකුණු සංඛ්‍යාව 25 කි.) | |
| 03 | පරිගණක හැකියාව | ලකුණු 05 |
| 04 | වයඹ පළාත් සභාවේ ආදායම් සේවයේ කර ඇති සේවා කාලය වෙනුවෙන් අයදුම්පත් කැඳවන දිනට එක් පූර්ණ වසරක් සඳහා ලකුණු 01 බැගින් උපරිම ලකුණු 10 | ලකුණු 10 |
| 05 | ආදායම් සේවාවේ කර ඇති විශේෂ ව්‍යාපෘති සඳහා ලිඛිත ලේඛන එකකට ලකුණු 05 බැගින් උපරිම ලකුණු 10 | ලකුණු 10 |
| 06 | ඉදිරිපත් වීමේ හැකියාව හා පෞරුෂය සඳහා | ලකුණු 10 |
| | මුළු ලකුණු සංඛ්‍යාව | ලකුණු 100 |

09. *අයදුම් කළ යුතු ආකාරය :*

ආදර්ශ ආකෘතිය ප්‍රකාර සකස් කර ගන්නා ඉල්ලුම් පත 2018.06.22 දිනට හෝ ඊට ප්‍රථම ලැබෙන සේ වයඹ ආණ්ඩුකාරවර ලේකම්, වයඹ පළාත් ආණ්ඩුකාරවර කාර්යාලය, මාළිගාව, කුරුණෑගල යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය. අයදුම්පත් බහා එවන කවරයේ ඉහළ වම් කෙළවරේ "වයඹ පළාත් ආදායම් දෙපාර්තමේන්තුවේ පළාත් ආදායම් කොමසාරිස් තනතුර සඳහා අයදුම්පත" යනුවෙන් සඳහන් කළ යුතු ය. අයදුම්පත සමග පත්වීම් ලිපියේ හා විධායක නිලධාරි සේවා ශ්‍රේණිය 1 ශ්‍රේණියට උසස්වීම් ලද ලිපියේ සහතික කළ පිටපතක් එවිය යුතු ය.

10. අසම්පූර්ණ හා අවිධිමත් ඉල්ලුම්පත්‍ර කිසිම දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

වයඹ පළාත් ගරු ආණ්ඩුකාරතුමාගේ නියෝගය පරිදි,

එන්. පී. එම්. කාරියවසම්,
වයඹ ආණ්ඩුකාරවර ලේකම්.

2018 ජුනි මස 01 වැනි දින,
වයඹ පළාත් ආණ්ඩුකාරවර කාර්යාලය,
මාළිගාව,
කුරුණෑගල.

## ආදර්ශ අයදුම්පත්‍රය

**වයඹ පළාත් සහා රාජ්‍ය සේවයේ පළාත් ආදායම් සේවයේ පළාත් ආදායම් කොමසාරිස් තනතුර සඳහා බඳවා ගැනීම - 2018**
**(විධායක නිලධාරි සේවා ශ්‍රේණිය 1 ශ්‍රේණිය)**

01. නිලධාරියාගේ නම :

I. මුලකුරු සමග නම :................................................................................................

II. මුලකුරුවලින් හැඳින්වෙන නම :...........................................................................

02. ලිපිනය :

I. කාර්යාලීය ලිපිනය :...............................................................................................

II. පුද්ගලික ලිපිනය :.................................................................................................

03. දුරකථන අංකය :

I. රාජකාරි :...............................................................

II. පෞද්ගලික :................................................... ජංගම :.........................................................

04. උපන් දිනය :................................................. 2018.06.22 දිනට වයස : අවු. :................, මාස :................, දින :...................,

05. ජාතික හැඳුනුම්පත් අංකය : | | | | | | | | | | | | |

06. ස්ත්‍රී/පුරුෂ භාවය :...................................

07. පළාත්/දේශීය ආදායම් සේවයට පත් වූ දිනය :...........................................

08. දැනට දරන තනතුර :...............................................................................................